

# මුත්‍රා මාර්ගයේ ආසාදන

## Urinery Tract Infections (UTI)

සුව සටහන්



**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

මුත්‍රා ආසාදන ඉතා සුලභ රෝගී තත්වයකි. විශේෂයෙන්ම කාන්තාවන් කුඩා ළමුන් හා වයස්ගත අයට එය වැළඳීමේ ප්‍රවණතාව වැඩි ය. සෑම කාන්තාවන් දෙදෙනකුගෙන් එක් අයෙකුට හා පිරිමින් 20 දෙනකුගෙන් එක් අයෙකුට තම ජීවිතකාලය තුළ දී එක් වරක් හෝ මුත5ා ආසා දනයක් ඇති වන බව හඳුනාගෙන ඇත.

අපේ මුත්‍රා මාර්ග පද්ධතිය ප්‍රධාන කොටස් කිහිපයකින් සෑදී තිබේ. වකුගඩු, වකුගඩු වලින් මුත්‍රා පිටගත ගෙන යන නාළය (Ureters) හා මුත්‍රාශය හා මුත්‍රා මාර්ගයයි.

### මුත්‍රා ආසාදන ප්‍රභේද

- Urethritis - මුත්‍රා මාර්ගයේ ආසාදනය
- Cystitis - මුත්‍රාශයේ ආසාදන
- Pyelonephritis වකුගඩුවනල ඇති වන ආසාදන

මෙයින් මුත්‍රාශයේ හා මුත්‍ර මාර්ගයේ ආසාදන වඩා සුලභ වන අතර වකුගඩු වල ආසාදන එතරම් සුලභ නොවේ. නමුත් කළාතුරකින් හෝ ඇතිවුවහොත් ඒවා අන් ආසාදන වලට වඩා ප්‍රබල රෝග ලක්ෂණ ඇති කරයි.

බොහෝ විට මුත්‍රා ආසාදන ඇති කරන්නේ බැක්ටීරියා මගිනි.

### මුත්‍රා ආසාදන වල රෝත ලක්ෂණ

- ■ මුත්‍රා දැවිල්ල
- ■ මුත්‍රා කරන වාර ප්‍රමාණය වැඩිවීම
- ■ මුත්‍රාශය අවට වේදනාව - යටි බඩ රුදාව
- ■ මුත්‍රා සමග ලේ පිටවීම
- ■ මුත්‍රා කළ පසු මුත්‍රාශය සම්පූර්ණයෙන් හිස් නොවුණ බවක් දැනීම
- ■ උණ සීතල වෙව්ලීම
- ■ කොන්දේ රුදාව

ඉහත රෝත ලක්ෂණ අතරින් උණ සීතල වෙව්ලීම කොන්දේ වේදනාව වැනි රෝග ලක්ෂණ සමහර විට වකුගඩු ආසාදන නිසා ද ඇතිවිය හැකිය. එබැවින් එවැන් රෝග ලක්ෂණ පෙන්වයි නම් ඉක්මණින් වෛද්‍ය උපදෙස් ලබාගත යුතුය.

### මුත්‍රා ආසාදන ඇතිවීමට හේතු

අපේ ශරීරයේ මුත්‍රා සාමාන්‍යයෙන් ක්ෂුද්‍රජීවීන්ගෙන් තොර ය. මුත්‍රා මාර්ගයේ ආසාදන ඇතිවීමට නම් බැක්ටීරියා දිලීර හෝ වෛරස වැනි ක්ෂ්ද්‍ර ජීවීන් පිටතින් ඇතුල්විය යුතුය. බොහෝ විට ඔවුන් ඇතුල්වන්නේ මුත්‍රා මාර්ගයෙනි. ඉතා කලාතුරකින් රුධිරය හරහා ද ඇතුල්විය හැකි ය.

මුත්‍රා ආසාදන ඇති කරන ඉතාම සුලභ බැක්ටීරියාව වන්නේ Ecoli නමැති බැක්ටීරියාවයි. එය බොහෝ විට අපේ ගුද මාර්ගයේ සිට පිටතට පැමිණ මුත්‍රා මාර්ගය හරහා ශරීරයට ඇතුල්වේ.

තවද ලිංග ආශ්‍රිතව පැතිරෙන Chlamydia Mycoplasma වැනි ක්ෂුද්‍රජීවීන්ද මුත්‍රා ආසා දන ඇති කරයි. එවැනි ආසාදන වැළඳුණ අයගේ ලිංගික සහකරුවන්ද පරීක්ෂාවට ලක් කර ප්‍රතිකාර ලබාගත යුතුය. එසේම අන් අයට ලිංගික සංසර්ගය මගින් පැතිරීම වැළැක්වීමට පියවර ගත යුතු ය.

### මුත්‍රා ආසාදන ඇතිවීම සඳහා අවදානම් සාධක

සමහර පුද්ගලයන් මුත්‍රා ආසාදන ඇතිවීමට වැඩි අවදානමක් දරන බව පෙනීගොස් ඇත. එවැනි අය නම්

- ■ කාන්තාවන් - විශේෂයෙන්ම ලිංගිකව සක්‍රිය අය. මක්නිසාදයත් කාන්තාවන්ගේ මුත්‍රා මාර්ගය සෙන්ටිමීටර් 4 ක් පමණ කෙටි දිගකින් යුක්තවීම හා ගුද මාර්ගය හා මුත්‍රා මාර්ගය එකම තලයක කුඩා දුරකින් පිහිටීම නිසා ගුද මාර්ගය හරහා පිටතට පැමිණෙන බැක්ටීරියා මුත්‍රා මාර්ගයට පහසුවෙන් ඇතුල්වීමේ ඉඩ කඩ වැඩි නිසා ය.
- ■ මුත්‍රා බට හෙවත් කැතීටර යොදා ඇති රෝගීන්
- ■ දියවැඩියා රෝගීන්
- ■ පුරස්ථි ග්‍රන්ථියේ රෝග ඇති පිරිමින්
- ■ මුත්‍රා පද්ධතියේ ආවේනික රෝග ඇති ළමුන්

### මුත්‍රා ආසාදන ඇති බවට රෝග නිර්ණය කරගන්නේ කෙසේද?

ඉහත සඳහන් කළ රෝග ලක්ෂණ පවතින අයෙකුට රෝගය වැළඳී ඇති බවට සැක කරනු ලැබේ. එවන් අයෙකුගේ මුත්‍රා සාම්පලයක් පරීක්ෂා කිරීම මගින් ආස-ාදනයක් ඇති බව කහවුරු කරගත හැකිය.

එසේම යම් ක්ෂුද්‍ර ජීවියෙක් හඳුණා ගතහොත් එයට වඩා සුදුසු ඖෂධ වර්ගය - උදා Antibiotics - කුමක්ද යන්නද රසායනාගාරය මගින් පරීක්ෂා කර වෛද්‍ය වරයාට දැනුම් දෙනු ලැබේ. මෙය Antibiotic Sensitivity Test ලෙස හඳුන්වයි.

### මුත්‍රා ආසාදන සඳහා ප්‍රතිකාර හා වළක්වාගන්නා ක්‍රම

බොහෝ විට ප්‍රතිජීවක ඖෂධ හෙවත්" මගින් ප්‍රතිකාර කරනු ලැබේ. එසේම පහත සඳහන් ක්‍රම අනුගමනය කිරීමෙන් නිතර මුත්‍රා ආසාදන සෑදීම වළක්වා ගත හැකි ය.

- ■ නිතර වතුර පානය හා අනෙකුත් දියර වර්ග වැඩිපුර පානය කිරීම
- ■ මුත්‍රා මාර්ගය හා ගුද මාර්ගය ආශ්‍රිත ප්‍රදේශය පිරිසිදුව තබා ගැනීම
- ■ මුත්‍රා කිරීමේ අවශ්‍යතාව ඇතිවූ විට මුත්‍රා පිටකිරීම (Without holding on)
- ■ ලිංගික සංස්ර්ගයෙන් පසු මුත්‍රා පිටකර මුත්‍රාශය හිස් කිරීම
- ■ යෝනි මාර්ගය ආශ්‍රිත දිලීර රෝග (Thrush) ආදියට ඉක්මණින් ප්‍රතිකාර ලබාගැනීම

මීට අමතරව වැනි විවිධ පාන සමහර අය පාවිච්චි කරති. එවැනි ක්‍රම වල ප්‍රතිඵල සියයට සියයක් විද්‍යාත්මකව තහවුරු කර නැත.

**ඇබෑර්තු**

**විදුලිකාර්මිකයන් සහ පුහුණුවන්නන් අවශ්‍යයි**

විමසන්න

**සුජිත් - 0432 922 427**